

# වික්ටර් - නන්දා සුරම්‍ය ගී ප්‍රසංගයට

**සුනිල් කුමාර යකුපිටියගේ**

සංගීතය විශ්ව භාෂාවකි. එහි මූලික පැතිකඩ ලෙසට දොම්නස හෝ සොම්නස සවනත තුලින් මනසට ලබාදෙන්නට සංගීතයට හැකිබව සත්‍යකි. එය සන්නිවේදන මාධ්‍යදක් ලෙස හඳුන්වන්නටද පුළුවන. ගීතය බිහිවන්නේ සංගීතය හා ගායනය මුසුවීමෙනි. ගීත රචකයා ගීතයට පද පෙළක් සපයන විට, සංගීතඥයා සංගීතයෙන් සහ ගායකයා ගායනයෙන් ගීතයට ජීවයක් ලබාදෙයි. ගායකයා හෝ ගායිකාව මානව හදවත් තුල නොමැකී පවතින්නේ ඉහත කී කාරනා මධුර හඬට එක් වූ විට පමණි. එවැන්නන් සංගීත ලෝකයේ දැවැන්තයන් වන්නේ නිරායාසයෙනි.

සංගීතයේ හිනිපෙත්තට අවතීර්ණ වන සංගීත ශිල්පීහු ජනතා ප්‍රසාදය ලබමින් නොයෙක්ත් ගරු බුහුමන් වලට ලක් වෙති. මේ අප සැරසෙන්නේ අග්‍රගන්‍ය කලා කරුවන් දෙපලක් සමග හෝරා කිහිපයක් ගත කරන්නට මෙල්බන් වාසී අප වාසනාවන්ත වී ඇති බව පැවසීමටය. එකම වේදිකාවක ගී ගයන ඒ සුමධුර ශිල්පින් හට සුරම්‍ය ගී ප්‍රසංග වේදිකාව සරසෙන්නේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයීය ආදිශිෂ්‍ය සංගමය විසිනි.

දිවි මගෙහි මෙතෙක් දුර
මා සමග ගමන් කල
මා සමග ඉකිබිඳ
රසික ඔබ මට කුමුදෙකියි
ගඟුලෙකියි
පහනෙකියි
පවනෙකියි

මෙවදන් අප මතකය අවදිකරමින් පවන ප්‍රසංගය කරා රැගෙන යන්නේ අප නොදැනුවත්මය. පවන සංගීත ප්‍රසංගයේදී සප්තස්වර සමහ හද මැවෙන ගීතයන්ගේ අර්ථයට ලයාන්විතව හඬ මැවුයේ ඇයයි. ඒ නන්දා මාලනී නම්වූ අග්‍රගණ්‍යයේ ගායිකාවයි. 1943 වසරේ අගෝස්තු 23 වෙනි දින අළුත්ගමදී උපත ලැබූ ඇය, සංගීත දිවියේ පසුකල ජයග්‍රාහී කඩඉම් බොහෝය.

එකොලොස් වතාවක් හොඳම ගායිකාවට හිමි සරසවි සම්මානයෙන් පිදුම් ලැබීමත් අට වතාවක් හොඳම ගායිකාවට හිමි ජනපති සම්මානයෙන් පිදුම් ලැබීමත් ඇගේ වාසනාවක් යයි මා සිතනවා.

පූජාසනයේ ඔබ හිඳුවා
ඔබට පුදන මේ ලෝකයමයි හෙට
ඔබට එරෙහිවී නැගිටින්නේ
ඉසුරින් කිත් යසසින් බබලනදා
ඔබගේ බැනුමම් ගීයක් වේ
ඉසුරින් කිත් යසසින් පිරිහුණ දා
සිනාසුනත් එය වරදක් වේ
කිරියෙන් පැණියෙන් උතුරා යන කල
ලොව ඔබ පාමුල හඬා වැටේ
අතමිට හිඟවී බලසුන් වනකල
ලොව ඔබ හිස මත කඩා වැටේ

සත්‍ය යේ ගීතය ප්‍රසංගය තුලින් ශ්‍රී ලංකාව තුල පෙරළි කරමින් අද නවීන තාක්ෂණයට පවා නොදෙවෙනි සන්නිවේදන මාධ්‍යයක් මෙන් ශ්‍රී ලාංකික හදවත් දැනුවත් කලේ සංගීත ආශ්වාදයද නොමැකෙන ලෙස සනිටුහන් කරමිනි. පාලකයන්ගේ සහ සමාජයීය දුර්වල කම් අඩුපාඩුකම් පෙන්වාදෙමින් සත්‍ය යේ ගීතය ප්‍රබල සමාජ මෙහෙවරක් කර ඇති බව කිවහොත් එය අතිශයෝක්තියක් නම් නොවන්නේමය.

සම්බුද්ධ සද් ධර්ම අනුහසින්
ගෝවින්ද ශ්‍රීධ ස්කන්ධ ශාන්තියෙන්
කමලාසනාරූඪ සරස්වතී
ආශිර්වාදයෙන්
රසික ඔබ මිලනයෙන් ආනන්ද ජනක වූ
මෙසොඳුරු රාත්‍රීයේ
සුවහසක් සවන් යුග ප්‍රී තියෙන් උදම්
වේවා
ප්‍රීතියෙන්...... උදම්....... වේ......වා

මහාචාර්ය සුනිල් ආරියරත්න යන් විසින් රචනා කරණ ලද මෙම සෝස්ත්‍රය 1973 වසරේ ජූලි මස 20 වෙනි දින පැවත් වූ පළමු ස ප්‍රසංගයේ සිට 1912 ජූලි 20 වන දින වෙදිකගතාකළ සමාප්තිය ප්‍රසංගය දක්වා, ඒක පුද්ගල ප්‍රසංග 1450 ක් වේදිකාවේ පවත්වාගෙන යාමට තරම් ආශිර්වාදාත්මක බලයක් ලබා දුන්නාද, එසේත් නැතිනම් චින්තන ජයසේනයන් විසින් ස ප්‍රසංගය නමින් නම් කිරීම තුළ ජ්‍යෝතිෂ්යගමය බලයක් හෝ වෙනයම් රුකුලක් ලැබුනාද යන්න කියන්නට මම නොදනිමි.

නමුත් මා දන්නා සත්‍යයක් ඇත. ස ප්‍රසංගය මෙතරම් කාල පරිච්ඡේදයක් තුළ මෙවන් වාර ගණනක් වේදිකාව මත ගැයෙද්දී ප්‍රසංග ශාලාව පිරී ඉතිරී ගිය යුගයක් මා අසා නැත.

මෙතරම් කලා පරපුරක් ශ්‍රී ලාංකීය කලාකෙතට බිහිකළ තවත් තක්ෂිලාවක් අප සංගීත වංශ කතාවේ කොතැනක හෝ සඳහන්ව ඇති බවද මා අසා නැත.

ජනප්‍රි අනුකරණ ගී ප්‍රභාවයට ගොදුරුවී සිටි රසික බහුතරයක් වික්ටර් රත්නායකයන්ගේ පුරෝගාමිත්වයෙන් ගී රස වින්දනයේ නව මංතලාවට පිවිසෙන්නට වරම් ලැබීම, සැබෑ ශ්‍රී ලාංකික ගීත කලාව පෝෂණය වන්නට අඩිතාලමක් වුවා සේම උසස් සංගීතය රස විඳින්නට හැකි බුද්ධිමත් රසිකයන් ශ්‍රී ලංකාව තුල බිහිවීම තුල අප ඔහුට කෙතරම් කෘතවේදී විය යුතුදැයි මට නොවැටහේ. හෙළ සංස්කෘතික උරුමයෙන් පෝෂණය වූ දේශීය අනන්‍යතාව මතු කරමින් ගෙතුන ගී පද වැලෙහි භාවාර්ථ උද්දීපනය කරන ස්වර අලංකරණයෙන් හා මධුර තනු උත්පාදනයෙන් නැගෙන හඬට පෙම් බැඳි රසික කැල නව මාවත ගී රස විඳින්නට පෙළඹීම අප ලද භාග්‍යයකි.

එදා ස්වතන්ත්‍ර නිර්මාණ කරුවන් තනිවී සිටි අවධියකි. ඔවුන්ගේ නිර්මාණ වලට තෝතැන්නක් වීමත් නව නිර්මාණ වලට පැහැදිලි මං පෙත් හෙළිවීම තුලින් සංගීත කලාවේ පිබිදීමකට මේ යුගය පත් වීමට සමත් විය.

1942 වසරේ පෙබරවාරි 18 වන දින කඩුගන්නාව ප්‍රදේශයේ උපත ලද වික්ටර් රත්නායක 1963 වසරේ රජයේ සංගීත විද්‍යාලයට ඇතුලත්වී එහි අධ්‍යානය නිමකොට 1963 වසරේ රජයේ සංගීත ගුරුවරයකු ලෙස බණ්ඩාරවෙල එත්තලපිටිය මහා විද්‍යාලයෙන් ඔහුගේ කලා මෙහෙවර ඇරඹුවේය. සුන්දර පරිසරයත් සංවේදීතාවයත් මුසුකරගත් සේන වීරසේකරයන්ගේ පද වැලකට ගායනා කළ

සිහිල් සුලන් රැල්ලේ
ඔබේ සුවඳ මුසුවේ

ආදරයේ සිනිදු පහස ලැබ
සුදුමැලි කතරේ පිපුන මල වගේ
ලොවුතුරු රස ගංගා
ඔබේ ආදරේ වරුසා වැහලා
කතර දෙව් ලොවක් වේ

සීත හිමව් කඳු ගැට අතරේ
සෙනෙහස දිය දහරා
ඈත හිමේ කඳු අතරේ පාවෙන
අමා සුවය පැතුවේ .

මෙම ගීතයට ඇත්තේ දශක 4ක පමණ අතීතයකි.එය එදාමෙන් අදටත් රසවිඳීමේ කිසිම් ගැටළුවක් නැත. හෙටත් මෙහි රසය නොවෙනස්ව පවතී. කළා නිර්මාණයක අතීතය වර්තමානය සහ අනාගතය තීරණය කරනු ලබන සාධකය කුමක්ද යන පැනයට පිළිතුර ජූනි මස 4 වනදින සුරම්‍ය ගී ප්‍රසංගය නැරඹීමෙන් ඔබට පසක් වනු ඇතැයි මගේ විශ්වාසයයි. මෙම ප්‍රසංගය සාර්ථක කර ගැනීමට සංගීතයෙන් දායක වන්නේ ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන සුරේෂ් මාලියද්ද ඇතුළු දක්ෂ සංගීත ශිල්පීන් හා මෙල්බර්න් නුවරින් එක්වන ප්‍රවීණයන් කිහිප දෙනෙකු විසිනි.

## මෙල්බන් බක් මහ උළෙලේ ටොයොටා මෝටර් රථය දිනාගත් ජයග්‍රාහිකාව

